# ගෝලීය උණුසුම හා ජීවයේ පැවැත්ම

**රංජිත් විමලසිරි**
**පරිසර කළමනාකරණ නිලධාරි, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය**

ලෝක කාලගුණ විද්‍යාවේ ප්‍රවීණයකු සේ සැලකෙන ජේම්ස් ඊ. හැන්සන් මහතා මීට වසර 32 කට පමණ පෙර පැවසුයේ ගත වූ සියවසක පමණ කාලය තුළදී ෆැරන්හයිට් අංශක එකකින් පමණ ගෝලීය උෂ්ණත්වය ඉහල ගොස් ඇති බවයි. ඔහු දක්වන පරිදි කාර්මික වශයෙන් දියුණු රටවල් හරිතාගාර ආවරණ හා කර්මාන්ත ශාලා ආදියෙන් පිට කරනු ලබන කාබන්ඩයොක්සයිඩ්, වායු ගෝලයට එකතු වීම තුලින් මේ තත්ත්වය වඩා වර්ධනය වී ඇති බවයි . හැන්සන් මහතා වැඩි දුරටත් පවසා සිටියේ මෙලෙස උෂ්ණත්වය ඉහළ යාම නිසා ලෝකයේ බොහෝ රටවල දරුණු ගංවතුර, සුළි සුළං, කුණාටු ආදිය ඇති විය හැකි බවයි. මේ වන විට ඔහුගේ අනාවැකි සියල්ල සිදුවී හමාරය. මිහිතලය උණුසුම් වීමත් සමග වර්ෂාපතනයේ ඇති වන වෙනස්කම් ප්‍රධාන තැනක් උසුලයි. වර්තමානය වන විට අප ද දේශගුණ විපර්යාස වලට මුහුණ දෙමින් සිටී.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ තතු දත්ත වාර්තා සලකා බලන කල පරිසරය උණුසුම් වීමෙන් ඇතිවන වැඩිම තර්ජනයන්ට ලක් වන රටවල් වනුයේ ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් වීම, ශ්‍රී ලාංකිකයන් ලෙස අපගේ අවධානය මේ කෙරෙහි යොමු කරවීමට පහත සඳහන් කරුණු ද දැඩිසේ බලපායි.

- ගෝලීය උණුසුම ඉහළ යාමත් සමග සාගර මට්ටම ඉහල ගොස් ටුවාලූ, මාෂල් වැනි කුඩා දූපත් යට වීමේ අවධානම.

- පරපෝෂිතයන් මගින් බෝවන රෝග, මන්ද පෝෂණය, ස්වසනාබාධ, මදුරු උවදුර, ජල දූෂණයෙන් ඇති වන පාචනය වැනි රෝග පමණක් නොව සමේ රෝග බහුලව ව්‍යාප්ත වීමත් උණුසුම් කාලගුණය දරා ගැනීමේ අපහසුතාවය නිසා හෘද රෝග, ආඝාතය වැනි තත්වයන් ඇතිවීමේ අනිටු විපාක.

- හරිතාගාර වායූන් විශාල ලෙස වායු ගෝලයට මුදා හැරීම නිසා සූර්යයාගෙන් මිහිතලයට වැටෙන අහිතකර කිරණ පාලනය කිරීම සඳහා ඇති ඕසෝන් ස්ථරයට මේ වන විට ප්‍රබල ලෙස බලපෑම් ඇති වී තිබේ. ඕසෝන් ස්ථරය සිදුරු වීම නිසා පෘථිවිය සිප ගන්නා එම අහිතකර කිරණ මගින් මිනිසාට අක්ෂිගත රෝග අවධානම බහුලව දැක ගත හැක. ඇසේ සුද මතු වීම ඉන් ප්‍රධාන තැනක් ගනු ලබන අතර එය නොසලකා හැරීම තුලින් දෑස් අන්ධ වීම පවා සිදු වීමට ඉඩ තිබීම.

පරිසරයේ උණුසුම් වීම සම්බන්ධව වැඩි වගකීමක් දැරිය යුතු වන්නේ කාර්මික විප්ලවයෙන් පසුව ලොව දියුණු යයි පවසන රටවල් විසින් ස්වාභාවික පරිසරය අභිබවා යමින් කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් හේතුකොට ගෙන වුවත් ඉන් ඇති වන බලපෑම් වලට මුහුණ දීමේ දී එය සියලු දෙනාටම අත් විඳින්නට වේ නම් ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින ආසියාතික රටවල වෙසෙන අපට සිදුව ඇත්තේ අනුන් කරන වැරදි වලට පොදුවේ දඩුවම් විඳීමටයි.

වායුගෝලය උණුසුම් වීමෙන් ඇතිවන තර්ජන සඳහා අප වැනි තුන්වන ලෝකයේ රට වල වෙසෙන්නන්ට ඔවුන්ගේ දුප්පත්කම නිසා එහි තර්ජන වැඩිපුර අත් විඳීමට හේතු සාධක වී ඇති බව පවසන ලෝක සෞඛ්‍ය සංවිධානය, මේ තත්වයට තුන්වන ලෝකයේ රටවල් මුහුණ දීමට නම් දියුණු රටවල් වලින් තුන්වන ලෝකයේ රටවල් සඳහා දෑත් දිගු කිරීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කර තිබේ.

2014 වර්ෂයේ ලෝක පරිසර දිනය "දේශගුණ විපර්යාසවල බලපෑමෙන් දූපත් රාජ්‍යයන් රැකගනිමු" යන තේමාව මූලික කරගෙන සැමරීමට මුළු ලොවම කටයුතු කිරීම මගින් මෙම කුඩා දූපත් රාජ්‍යයන් දේශගුණ විපර්යාසවල බලපෑමෙන් මුදවා ගැනීමට ලෝකය විසින් දරණ තවත් මහගු ප්‍රයත්නයක් බව කිව හැකිය.

**මයන්ත මුතුකුමාරණ**
**රාජ්‍ය කළමනාකරණ සහකාර, ගිණුම් අංශය**
**පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**

බත බුලතින් සපිරි වූ එදා
නිසි කලට පායන,
නිසි කලට වසින,
තිර වූ දෙස්ගුණයක් තිබුණි
යල හා මහ නම් එය විය
බිජු වපුරන්නත් - අස්වනු නෙලන්නත්
නිසි කලට කරන්නට
දැන සිටියෝය - අප මුතුන් මිත්තෝ

විදුනැණෙන් පිරිපුන් මෙදා
යලට වසින්නත්,
මහට පායන්නත්,
වසත් සමයට මල් මිලින වන්නත්
ගිම්හානයේ තුරු සුපුෂ්පිත වන්නත්,
සිසිරයේ හිම දිය වී යන්නත්,
සරත් කල ලොව අග්නි වන්නත්
වරින් වර විය

මෙවන් වෙනසක් සිදු වෙතැයි කී
දෙස්ගුණ විදුදනන් බස්
අද සැබෑ වී ඇත.
අහෝ දෙස්ගුණ පෙරළියක මහත